

# 23 - දත්ත අර්ථකථනය




ආදරනීය දුවේ / පුතේ ,

මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට ,

- වගුමගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීමට සහ
- චිත්‍ර ප්‍රස්තාර මගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීමට හැකියාව ලැබේ.

6 ශ්‍රේණියේ පංති කාමරයක සිදු වූ සංවාදයක් පහත දක්වා ඇත. එය හොඳින් කියවන්න.

**ගුරුතුමිය** ආයුබෝවන් මගේ දරුවනේ !

**ළමයි** ආයුබෝවන් ටීචර් !

**ගුරුතුමිය** අපි ඊයේ ඉගෙන ගත්ත පාඩම ඔයාලට මතකද ? තරුෂි කියන්න බලන්න අපි ඊයේ ඉගෙන ගත්තේ මොනවද කියලා.

**තරුෂි** අපි ඊයේ තොරතුරු රැස් කිරිමේදී ප්‍රගණන ලකුණු යොදාගන්නා ආකාරය ඉගෙන ගත්තා.

**ගුරුතුමිය** බොහොම හොඳයි. තව මොනවද අපි ඉගෙන ගත්තේ

**සෙනාෂා** චිත්‍ර ප්‍රස්තාර භාවිතයෙන් තොරතුරු නිරූපණය කිරිමටත් ඉගෙන ගත්තා.

**ගුරුතුමිය** බොහොම හොඳයි දරුවනේ. එහෙම නම් අද අපි බලමු මේ වගුව දිහා.

පසුගිය වසර 5 ක් තුළ එක්තරා කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන ලද බෝනික්කන් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | බෝනික්කන් ගණන |
|---|---|
| 2015 | 20 000 |
| 2016 | 22 000 |
| 2017 | 25 000 |
| 2018 | 27 000 |
| 2019 | 29 000 |





ගුරුතුමී - දරුවනේ, මෙම වගුව දිහා හොඳට බලන්න. නිපුන් කියන්න අඩුම බෝනික්කන් ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද වර්ෂය කුමක්ද? කියලා

නිපුන් - 2015 ටීචර්

ගුරුතුමී - බොහාම හොඳයි. පූර්ණ කියන්න, 2018 වර්ෂයේ නිෂ්පාදනය කර ඇති බෝනික්කන් ගණන කීයද ?

පූර්ණ - විසිහත් දහසයි ටීචර්

ගුරුතුමී - බොහොම හොඳයි. කාටද කියන්න පුළුවන් 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ බෝනික්කන් කොපමණ ප්‍රමාණයක් වැඩිපුර නිෂ්පාදනය කර තිබෙනවාද කියා.

අමාලි - තුන් දහසයි ටීචර්

ගුරුතුමී - බොහොම හොඳයි දරුවනේ. මෙම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය ගැන විශේෂත්වයක් කාටහරි කියන්න පුළුවන්ද?

මිතිලා - සෑම අවුරුද්දකම කලින් අවුරුද්දට වඩා වැඩි නිෂ්පාදනයක් සිදුකර තියෙනවා.

තරිදු - කර්මාන්ත ශාලාවේ පසුගිය වසර 5 තුළ නිෂ්පාදනය කරල තියෙන මුළු බෝනික්කන් ගණන එකසිය විසිතුන් දහසයි.

නිපුනි - පසුගිය වසර පහ තුළම වැඩිම නිෂ්පාදනයක් සිදුකර තියෙන්නේ 2019 වර්ෂයේදීයි.

කල්පනා - නමුත් ටීචර් 2020 වර්ෂයේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කොවිඩ් - 19 වසංගතය නිසා අඩුවෙන්න පුළුවන්

ගුරුතුමීය - බොහොම හොඳයි දරුවනේ. කල්පනා දුව ප්‍රයෝගිකව හිතලා උත්තරයක් දුන්නා. ඒක ගොඩක් හොඳයි.

ආදරණීය දරුවනේ ,

වගුමගින් නිරූපිත දත්ත අර්ථකථනය කිරීමට දැන් ඔබට පුළුවන්. ඒ නිසා පෙළපොතේ 23.1 අභ්‍යාස කරන්න. ඔබගේ පිළිතුර නිවැරදි දැයි මෙම නිබන්ධනය අගට ලබාදී ඇති පිළිතුරු සමග සසඳන්න.



ගුරුතුමීය - දැන් දරුවනේ මෙම චිත්‍ර ප්‍රස්තාරය දෙස බලන්න.




◯ කින් 4000 ක් නිරූපණය වේ.





තරිඳු - ටීවර් ඔය තියෙන්නේ කලින් වගුව ඇසුරෙන් ඇඳපු චිත්‍ර ප්‍රස්තාරය නේද?

ගුරුතුමිය - බොහොම හොඳයි , තරිඳු. දැන් බලන්න. දුවේ , පුතේ මෙම චිත්‍ර ප්‍රස්තාරය ඇසුරෙන් ඉහත ප්‍රශ්නවලට ම පිළිතුරු සපයන්න පුළුවන්ද කියලා. අඩුම බොනික්කන් ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද වර්ෂය කුමක්ද?

අමාලි - 2015 ටීවර්. අඩුම දිග තීරුව තියෙන්නේ 2015 වර්ෂයේ

ගුරුතුමිය - බොහොම හොඳයි. 2018 වර්ෂයේ නිෂ්පාදනය කර ඇති බෝනික්කන් ගණන කීයද?

නිපුන් - 27 000 ටීවර් , හැබැයි ටීවර් චිත්‍ර ප්‍රස්තාරයට වඩා පහසුවෙන් වගුවෙන් ඒ තොරතුර ගන්න පුළුවන්.

ගුරුතුමිය - බොහොම හොඳයි නිපුන්, ඒක ඇත්ත. නමුත් තොරතුරු සංසන්දනය කිරීමේදී චිත්‍ර ප්‍රස්තාරය මගින් වඩා පහසුවෙන් තොරතුරු ලබාගන්න පුළුවන්. බලන්න 2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේ බෝනික්කන් කොපමණ ප්‍රමාණයක් වැඩිපුර නිෂ්පාදනය කර ඇත්දැයි බැලීමේදී වඩා පහසු ක්‍රමය මොකක්ද කියලා.

කල්පනා - ඔව් ටීවර් 2016 ට වඩා 2017 දී රවුම් තුන්කාලක් වැඩියි. ( ◔ ක් වැඩියි.) ඒ කියන්නේ 3000 ක් වැඩියි.

ගුරුතුමිය - බොහොම හොඳයි කල්පනා. තොරතුරු සංසන්දනයේ දී චිත්‍ර ප්‍රස්තාර යොදාගැනීම වඩා පහසු බව ඔබට වැටහුණා නේද?. දරුවනේ, පෙළපොතේ 23.2 අභ්‍යාසයේ දී ඇති ගැටළු ටික විසඳන්න. මෙම නිබන්ධනය අගට ලබාදී ඇති පිළිතුරු සමග ඔබේ පිළිතුර සංසන්දනය කර බලන්න.



පිළිතුරු පත්‍රය

23.1 අභ්‍යාසය

(01) (i) 2009

(ii) 2013

(iii) 1310

(iv) • වසරින් වසර ත්‍රී වීල් ලියාපදිංචි වන සංඛ්‍යාව වර්ධනය වේ.

(02) (i) අප්‍රියල් මාසයේදී 27 200 kg

(ii) ප්‍රකාශය අසත්‍යයි.

ජනවාරි මාසය 21 700 kg හා

මාර්තු මාසය 21 850 kg වන නිසා

(iii) 5350 kg ප්‍රමාණයකි.

(iv) ප්‍රකාශය සත්‍යයි.

27200 kg

25950 kg

53150 kg

53000 kg < 53150 kg

(v) සිංහල අලුත් අවුරුදු උත්සව පැවැත්වෙන කාල වකවානුව නිසා.

(03) (i) ප්‍රවණත්තිය සත්‍යයකි.

කිරි නිෂ්පාදනය වසරින් වසර වැඩි වී ඇති බව දී ඇති දත්ත අනුව නිගමනය කල හැකිය.

(ii) ලීටර 845800

(iii) නැත

23.2 අභ්‍යාසය

(01) (i) 1 වන සතියේ

(ii) 3 වන සතියේ

(iii) 500 කි

(iv) 2400 කි

(02) (i) 5 දෙනෙකි.

(ii) 27 දෙනෙකි.

(iii) 38 දෙනෙකි.

(03) (i) කුමුදිත

(ii) 12 කි

(iii) දිලිත

(iv) 13

(04) (i) රුපියල් 990 .00

(ii) බදාදා , ලැබුණු මුදල රුපියල් 1170.00

(iii) රුපියල් 4410.00

(05) (i) දිවුල්

(ii) රුපියල් 96

(iii) 1. ඉතිරිව ඇති බීම වීදුරු

| | | | |
|---|---|---|---|
| අඹ | 16 | දිවුල් | 4 |
| කොමඩු | 20 | අලිපේර | 12 |
| දොඩම් | 20 | | |

2.

